**දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචක - II- 2014**

---------------------------------------------------------------------------

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචකය- II 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹී අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය සැපයීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්ය සාධන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ සංරචක - II සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො මිලියන 10 කට සමාන විගැහි (SDR) මිලියන 6.5 ක් විය.ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගු වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල සම්පාදනයක් වන මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා  පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 විගණන මතය

----------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

---------------------------------------------------

1989 නොවැම්බර් 30 දිනැති අංක පී එම්/එස් පී/5 දරන අග්‍රාමාත්‍ය කාර්යාල චක්‍රලේඛය අනුව, විදේශ සම්මන්ත්‍රණ හෝ සම්මේලන සඳහා සහභාගී වන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන් දිවයිනට පැමිණ දින 7 ක් ඇතුළත වාර්තා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2014 මැයි 19 සිට 24 දක්වා ස්විට්සර්ලන්තයේ පැවැත්වූ ලෝක සෞඛ්‍ය සමුළුව සඳහා සහභාගී වූ ජේ්‍යෂ්ඨ අමාත්‍යාංශයේ නිලධාරීන් 4 දෙනෙකු විසින් වෙන වෙනම ඔවුන්ගේ වාර්තා 2014 දෙසැම්බර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ඒ සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 2.34 ක මුදලක් වැය කර තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---------------------------------------

3.1 අරමුදල් උපයෝජනය

----------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වාර්තා අනුව ණය මුදල් මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කරන ලද අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංස සංරචකය - II | 10 | 1,304 | 200 | 0.03 | 3.43 | 0.03 | 3.43 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඇතුළත අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය ආදි වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක මතු කර දක්වමින් උප සංරචක 4 ක් සඳහා රු.මිලියන 1,304 ක් උපයෝජනය කිරීමට විස්තීර්ණ ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් ව්‍යාපෘතියේ සංරචක - II සඳහා පිළියෙල කර නොතිබුණි.

(ආ) උප සංරචක යටතේ කාර්යයන් 4 ක් සිදු කර 2014 වර්ෂය තුළ රු.මිලියන 200 ක මුදලක් උපයෝජනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණද, ධාරිතා වර්ධන උප සංරචකය යටතේ විදේශ පුහුණු කාර්යයන් සඳහා රු.මිලියන 3.43 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතියේ සංරචක - II සඳහා රු.මිලියන 1,304 කට සමාන එජඩො 10 ක මුදලක් වෙන් කර තිබූ අතර රු.මිලියන 3.43 කට සමාන එජඩො මිලියන 0.03 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 04 ක කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම් සම්පූර්ණයෙන් උපයෝජනය කිරීම සැක සහිතය.

3.2 භෞතික ප්‍රගතිය

------------------

නවෝත්පාදනයන්, ප්‍රතිඵල නියාමනයන්, ධාරිතා වර්ධනය හා සේවකයන් යෙදවීම සහ පරිපාලන කාර්යයන් ආදී උප සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ සංරචකය - I සඳහා සහාය සේවා ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතියේ සංරචකය II හි කාර්යයන් වලින් අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ යුතු නවෝත්පාදනය, පර්යේෂණ අධ්‍යයනය හා ප්‍රජා විද්‍යා සෞඛ්‍ය සමීක්ෂණ ආදී කාර්යයන් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.